# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 160/54 — 1975 අප්‍රේල් 19 වැනි සෙනසුරාද — 1975.04.19

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය—සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

### 1975 අංක 4 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝග

**68 (1) වන නියෝගය යටතේ වූ ආඥාව**

මෙහි උපලේඛනයෙහි දක්වා ඇති නම් වලින් සාමාන්‍යයෙන් හඳුන්වනු ලබන සංවිධාන සම්බන්ධයෙන් ඒ සංවිධාන විසින් හෝ ඒවායේ සාමාජිකයන් හෝ පාක්ෂිකයන් විසින් මහජන ආරක්ෂාවට, මහජන සාමය පවත්වා ගැනීමට හෝ අත්‍යවශ්‍ය සේවා වත් පවත්වා ගැනීමට හානිකරවූ කාර්යයන් සඳහා නොහොත් 1975 අංක 4 දරන හදිසි අවස්ථා (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 24 වෙනි නියෝගයේ (අ) සිට (උ) දක්වා වූ ඡේදවල හෝ 38 වන නියෝගයේ (2) වන ඡේදයේ (අ) සහ (ආ) යන අනුඡේදයන්හි සඳහන් කාර්ය කිසිවක් සඳහා ක්‍රියා කිරීමේ නොහොත් ඒ සංවිධාන හෝ ඒවායේ සාමාජිකයන් හෝ පාක්ෂිකයන් ප්‍රයෝජනයට ගැනීමේ අන්තරාය ඇතැයි සෑහීමකට පත්වූයෙන්, අග්‍රාමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, ඒ සංවිධාන තහනම් කරනු ලැබූ සංවිධාන ලෙස ඒ නියෝගවල 68 වෙනි නියෝගයේ (1) වන ඡේදයෙන් මා වෙත පවරනු ලැබූ බලතල ප්‍රකාර මේ ආඥාවෙන් ප්‍රකාශ කරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

1975 අප්‍රේල් මස 19 වන දින,
කොළඹ.

### උපලේඛනය

පෙරදිග සුළං කල්ලිය
කලුපහන
ලංකා විප්ලවකාරී තරුණ සංවිධානය
ජනතා විමුක්ති පෙරමුණ

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

137A——ඒ 13601—2,100 (75/04)